(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 226.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2017 නොවැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

688/’16

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනප්‍රිය පාසල් අතර පවත්වන වාර්ෂික මහා ක්‍රිකට් තරඟ සඳහා බියර් සමාගම් අනුග්‍රහය දක්වන බවත්;

(ii) එම තරඟ පැවැත්වෙන අතරතුර බියර් සමාගම් තම ප්‍රචාරක කටයුතු සිදු කරන බවත්;

(iii) මේ හරහා පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹෙන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පාසල් අතර පවත්වනු ලබන වාර්ෂික මහා ක්‍රිකට් තරඟ සඳහා අනුග්‍රාහකයන් සොයා ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේද හා නිර්ණායක අමාත්‍යාංශය විසින් නිර්දේශ කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේද හා නිර්ණායක කවරේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා ක්‍රමවේද හා නිර්ණායක නිර්දේශ කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රිකට් තරඟ ආශ්‍රිතව මත්ද්‍රව්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කිරීම නතර කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1982/’17

ගරු කනක හේරත් මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර දෙක තුළ පුහුණු කර ඇති ආධුනිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉදිකිරීම් සහ කාර්මික අංශය සඳහා පුහුණුව ලබාදී ඇති ආධුනිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ප්‍රමාණයෙන් රැකියාගත කර ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) පසුගිය වසර දෙක තුළ කාර්මික අංශයේ හා ඉදිකිරීම් අංශයේ පුහුණුව ලැබූ සංඛ්‍යාව ශ්‍රම බලකායේ ඉල්ලුමට ප්‍රමාණවත්ද;

(v) නොඑසේ නම්, බඳවා ගන්නා ආධුනිකයන් සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1999/'17

ගරු බිමල් රත්නායක මහතා,— කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;

(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;

(iii) 2015 වර්ෂයේ සිට 2017 වර්ෂයේ මේ දක්වා ගෙවා ඇති මුළු කුලී/බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;

(ii) එම පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

(iii) අමාත්‍යවරයා සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2075/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය මහ නගර සභා බලප්‍රදේශය තුළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ව්‍යාපෘතියක්, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශ වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණේද;

(ii) ඉහත ව්‍යාපෘතිය සඳහා සැලසුම් හා ව්‍යාපෘතියට අදාළ ටෙන්ඩර් කටයුතු සම්පාදනය කර තිබේද;

(iii) ඒ අනුව, මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබාදීමට ප්‍රංශ ඒජන්සි ආයතනය ඉදිරිපත් වී සිටින්නේද;

(iv) මෙම ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2119/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.01.09 දිනට සහ 2017.06.30 දිනට,

(i) යාපනය දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර තිබූ ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව;

(ii) එම කඳවුරුවලට අනුයුක්තව සේවය කළ මුළු නිලධාරීන් හා සෙබළුන් සංඛ්‍යාව;

(iii) එක් එක් කඳවුරෙහි නම, පිහිටා තිබූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ අනුයුක්තව සිටි නිලධාරීන් සහ සෙබළුන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015.01.09 සිට 2017.06.30 දක්වා යාපනය දිස්ත්‍රික්කයෙන්,

(i) ඉවත් කර ඇති ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව;

(ii) ගුවන් හමුදා කඳවුරුවලින් ඉවත් කර ඇති නිලධාරීන් හා සෙබළුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) යාපනය දිස්ත්‍රික්කයෙන් ගුවන් හමුදා කඳවුරු හා ඒවායේ සේවයේ නියුතු නිලධාරීන් හා සෙබළුන් ඉවත් කිරීම ජාතික ආරක්ෂාවට බලවත් තර්ජනයක් බව පිළිගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2124/’17

ගරු මයන්ත දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තෙත් කලාපයේ කුඹුරු පුරන්වීම ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනය අඩුවීමට මෙන්ම, පාරිසරික ගැටලුවකටද හේතු වී ඇති බව දන්නේද;

(ii) පුරන් කුඹුරු අස්වැද්දීම පිළිබඳව ක්‍රියාත්මකවන යෝජනා කවරේද;

(iii) වී වගාවෙන් ගොවියා ඉවත් වීමට බලපාන හේතු කවරේද;

(iv) ඒ සඳහා ලබාදෙන විසඳුම් කවරේද;

(v) කුඹුරු වගා කිරීමේ කාර්ය කරවීම සඳහා අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් සිටින නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(vi) එම නිලධාරීන් කවුරුන්ද;

(vii) මෑතකදී ගමකට, කාන්තාවන් 20 බැගින් වූ ගොවි සංවිධානයක් පිහිටුවීම මඟින් පුරන් කුඹුරු වගා කිරීමේ කාර්යය ඉටුවන්නේද;

(viii) නව කෘෂිකාර්මික ප්‍රතිපත්තිය තුළ පුරන් කුඹුරු වගාකිරීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ix) ප්‍රාදේශීය මට්ටමේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති සාර්ථක කර ගැනීම සඳහා එක් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයකට උපාධිධාරීන් සිව්දෙනා බැගින් බඳවා ගැනීමෙන් අපේක්ෂිත පරමාර්ථය ඉටු වී තිබේද;

(x) උපාධිධාරීන් වෙත පවරා ඇති රාජකාරි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2126/’17

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ ගොවිජන බලප්‍රදේශයේ, ගිරිඋල්ල විහාරස්ථානයට අයත් ජම්බුගහමුලදෙනිය නැමති කුඹුර නිසි අවසරයකින් තොරව පුරවා පෞද්ගලික මාර්ගයක් ඉදිකර ඇති බවත්;

(ii) මේ සඳහා කූඨ ලේඛන සකස් කිරීමට රජයේ මුදල් වියදම් කර ඇති බවත්;

(iii) ඉහත මාර්ගය ඉදිකර ඇත්තේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහයකවරයෙකුගේ නිවසක් සඳහා ප්‍රවේශ මාර්ගයක් වශයෙන් බවත්;

(iv) ඉහත මාර්ගයේ ආරම්භක කොටසද අනවසර ලෙස ඉදිකර ඇති බවත්;

(v) මෙම ස්ථානයේ අඩිපාරක් හෝ නොතිබුනු බවත්; ප්‍රාදේශීය සභාවට අයත් නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මහජන මුදල් අවභාවිතා කරන මෙවැනි නිලධාරින් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2168/'17

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 43 ප්‍රබෝධාගම ග්‍රාම නිලධාරී වසමේ, නාවක්කුලම ගම්මානයේ ගල් ඇඹරුම්හලක් ආරම්භ කිරීමට අවසර ලබා දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එසේ නම්,

(i) ගල් ඇඹරුම්හලේ බලපත්‍ර අංකය හා එය නිකුත් කළ දිනය;

(ii) අයදුම් කළ පුද්ගලයාගේ නම සහ අයදුම් කළ දිනය;

(iii) එම බලපත්‍රය නිකුත් කිරීමට පරිසර වාර්තාවක් ලබාගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ගල් ඇඹරුම්හල ආරම්භ කිරීමට පෙර ජනතා අදහස් විමසිල්ලට ලක් කර තිබේද;

(ii) එකී ඇඹරුම්හල සම්බන්ධයෙන් ජනතා විරෝධය පැන නැඟී ඇති බව දන්නේද;

(iii) මෙම ඇඹරුම්හල ආරම්භ කිරීමෙන් ප්‍රදේශයේ ජනතාවට සිදුවිය හැකි සෞඛ්‍ය හා පාරිසරික ගැටලු විසඳීමට කටයුතු කරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2018) — (දහඅටවැනි වෙන් කළ දිනය) — කාරක සභාව (නොවැම්බර් 29 දින ප්‍රගතිය)

*2.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ වෛද්‍ය උපකරණ මිල නියම කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 04 දිනැති අංක 2030/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*4.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල් මණ්ඩල පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2016.07.21 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*5.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.08.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*6.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1999 අංක 38 දරන විජය කුමාරතුංග අනුස්මරණ රෝහල් මණ්ඩල පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) සී වගන්තිය යටතේ 2016.08.12 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*7.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 වගන්තිය යටතේ 2017.01.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුබසාධන සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*8.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1970 අංක 07 දරන හෝමියෝපති පනතේ 40 වගන්තිය යටතේ 2017.01.25 වැනි දින ඉදිරිපත් කරන ලද 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුබසාධන සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*9.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා,— ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත අනුව 2016.10.25 වැනි දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.08.09 දින සලකා බලන ලදී.)

*10.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා,— ඉදිකිරීම් අභ්‍යාස සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1957 අංක 49 දරන රජයේ කාර්මික සංස්ථා පනතේ 2 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ හා 1992 ජූනි මස 10 දිනැති අංක 718/15 දරන අති විශේෂ ගැසට්පත්‍රය අනුව 2016.10.25 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ඉදිකිරීම් අභ්‍යාස සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.08.09 දින සලකා බලන ලදී.)

*11.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා,— රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ 2017.01.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.08.09 දින සලකා බලන ලදී.)

*12.

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2013,— 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 32 (3) වගන්තිය යටතේ 2016.04.05 වැනි දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2016.10.07 දින සලකා බලන ලදී.)

*13.

මුදල් හා ජනමාධ්‍ය  අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 12, 14 සහ 22 වගන්ති සමඟ කියවිය යුතු, 32 වගන්තිය යටතේ, සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 28 දිනැති අංක 2029/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.10.09 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 996 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 17 දිනැති අංක 2032/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),—2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 30 දිනැති අංක 2021/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 06 දිනැති අංක 2022/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 06 දිනැති අංක 2022/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 30 දිනැති අංක 2025/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 19 දිනැති අංක 2028/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 26 දිනැති අංක 2029/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජූලි 31 දිනැති අංක 2030/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 01 දිනැති අංක 2030/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 9),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 15 දිනැති අංක 2032/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 10),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 16 දිනැති අංක 2032/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 11),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 අගෝස්තු 23 දිනැති අංක 2033/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 12),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 සැප්තැම්බර් 08 දිනැති අංක 2035/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 13),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ඔක්තෝබර් 02 දිනැති අංක 2039/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව,— (235 අධිකාරය වන) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2017.11.18 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2017 අගෝස්තු 11 දිනැති අංක 2031/49 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රතිශෝධිත කෙටුම්පත සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මස 07 වැනි අඟහරුවාදා පිළිගන්වන ලද ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව,— සලකා බැලීම.

*31.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*32.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*33.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*34.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*35.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

36.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

39.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

40.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

41.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

42.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

43.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

44\.
ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.
විසර්ජන පනත් කෙටුම්පත (2018) නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

---